# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම
## 2013 දෙසැම්බර් මස 03 වන අඟහරුවාදා
### බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි
### බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.15 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**පැමිණීම :**

| | |
|---|---|
| ගරු අයි.ඒ. සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු ප්‍රසන්න රණතුංග | (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකි රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බල ශක්ති සහ වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා) |
| ගරු ජගත් අංගගේ | (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු උපාලි කොඩිකාර | (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු නිමල් ලාන්සා | (මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යතුමා) |
| ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල | (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත හා පරිසර කටයුතු අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණි | (සභා නායකතුමා) |
| ගරු මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු රේණුක දූෂ්‍යන්ත පෙරේරා | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| අමරසේකර, ශිරන්ත | තිලකරත්න, හෂාන් | මැන්දිස්, සුමිත් ලාල් |
| අම්ජාඩ්, එම්.එම්.එම්. | තිලකසිරි, ගාමිණී | යූසුෆ්, ඒ.එම්. |
| අල්මේදා, මහේෂ් | ද සිල්වා, ගාමිණී | රහීම්, එම්.එස්.එම්. |
| අබේරත්න, පී.ඩී. | ද සිල්වා, ජයන්ත | රහුමාන්, මොහොමඩ් මුජිබර් |
| උඩවත්ත, කීර්ති | ද සිල්වා, පියල් නිශාන්ත | රාජකරුණා, හර්ෂණ |
| උඳුගොඩ, ප්‍රදීප් | ද සිල්වා, සිරිකමල් පිලිෂියන් | රාජපක්ෂ, තිලකරත්න |
| එල්ලාවල, ලලිත් | ද සොයිසා, විජයමුණි සුමිත් | රාජපක්ෂ, දිලිප් කුමාර |
| කහටපිටිය, කිත්සිරි | දේවප්‍රිය, ඉසුර | රාම්, පංචරත්නම් |
| කාරියවසම්, ලයනල් | නිසාම්ඩීන්, එම්. අර්ෂාද් | රූපසිංහ, ආනන්ද රංජිත් |
| කුමාර, ජගත් | පියනන්ද ස්ථවිර, පූජ්‍ය තෙඹුවන | ලංකාතිලක මැතිනිය, අශෝකා |
| කුරුවිටගේ, මහින්ද | පාදුක්ක, නිරෝෂන් | වනිගරත්න, ලලිත් |
| කුලරත්න, ලාල් | පෙරේරා, තුෂාර | වර්ණකුමාර, ලලිත් |
| කොටකදෙනිය, එච්.එම්.ජී.බී. | පෙරේරා, අ. ශ්‍රීනාත් ම. | වරාගොඩ, රෙහෙන්සිරි |
| කොස්තා, ජේම්ස් ප්‍රිම්ලස් | පෙරේරා, දයාකාන්ත | වැලිවත්ත, ජනක් දීපාල් |
| කෝරළගේ, යසපාල | පෙරේරා, ප්‍රදීප් | විජයරත්න, මොරිස් |
| ගමගේ, සලෝචන | පෙරේරා, මෙරිල් | විජේසේකර, රවී |
| ගුණසේකර, විකුම් | පෙරේරා, ශ්‍රීනාත් | සකලසූරිය මැතිනිය, චන්ද්‍රිකා ගුණවර්ධන |
| චන්ද්‍රභානු, අධිකාරම්ගේ | ප්‍රනාන්දු, කිත්සිරි | සිරිවර්ධන මැතිනිය, සන්ධ්‍යා |
| චන්ද්‍රරත්න, නිමල් | ප්‍රනාන්දු මැතිනිය, රෝස් | සුමනසේකර, සරත් කුමාර |
| ජයකොඩි, චන්දන | බෙත්මගේ, හෙක්ටර් | සූරියබණ්ඩාර, ජානක |
| ජයකොඩි, සිසිර | මතුගමගේ, සුගත් | සෙනෙවිරත්න, රොජර් |
| ජයතිස්ස, නලින්ද | මල්ලව, නෙලුක් | ෆයිරූස්, මොහොමඩ් |
| ජයනාත්, ගුණසිරි | මවුජුඩ්, අජ්මාල් | ෆවුසි එම්. නවුසර් |
| ජයසිංහ, ලයනල් | මංචනායක, කිත්සිරි | ෆායිස්, මොහොමඩ් |

**නොපැමිණීම :**

| | |
|---|---|
| ගරු රංජිත් සෝමවංශ | (නියෝජ්‍ය සභාපතිතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| කාරියවසම්, කීර්ති | ද සිල්වා, සේනක දමයන්ත | රොද්‍රිගූ, රන්දීර් |
| කුමරගුරුබරන්, එන්. | පතිරණ, සරත් | ලක්තිලක, ශිරාල් |
| කුරුප්පු, කාමල් | පීරිස්, නිමල් ආර්. | විජේමාන්න, ලක්ෂ්මන් |
| ගුණරත්න, උපාලි | පෙරේරා, පෝල් | විජේරත්න, උදේන |
| ගුණවර්ධන මැතිනිය, කෝකිලා හර්ශනී | ප්‍රියන්ත, විජිත් | විජේසුන්දර, ශාලිත |
| ජයවර්ධන, නිහාල් | රාජපක්ෂ, වරුණ දීප්ති | සරණලාල්, චන්ද්‍රසෝම යූ.ජී. |
| ද සිල්වා, අනන්ද හරිශ්චන්ද්‍ර | රාජේන්ද්‍රන්, එස්. | සිල්වා, අමල් |

## 01. විගණකාධිපති වාර්තාවන් :

2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විස්තරාත්මක විගණකාධිපති වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

අනතුරුව, උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා විසින් [උපාලි කොඩිකාර අමාත්‍යතුමා වෙනුවෙන්] *"බස්නාහිර පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ 2009 වර්ෂයේ විගණකාධිපති වාර්තාව හා වාර්ෂික ගිණුම් පිළිබඳ වාර්තාව."* පිළිගන්වන ලදී.

***ගරු සභාපතිතුමා විසින් එකී විගණකාධිපති වාර්තාවන් පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කරන ලදී.***

## 02. කාරක සභා වාර්තා පිළිගැන්වීම :

ගරු සභාපතිතුමා විසින් පහත සඳහන් කාරක සභා වාර්තා පිළිගන්වන ලදී.

i. 2013.10.15 දින පැවති මහජන පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තාව.
ii. 2013.11.26 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව.

## 03. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනාව :

*"නිහාල් ජයවර්ධන ගරු මන්ත්‍රීතුමාට මාස 03 ක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි"* රේණුක පෙරේරා ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය.

## 04. පළාත් සභාවේ රැස්වීම :

ජගත් අංගගේ ගරු සභාකටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"2013 දෙසැම්බර් මස 06 වන දිනට නියමිත වැඩ කටයුතු අවසන්ව විසිර යෑමෙන් අනතුරුව, මෙම සභාව 2014 ජනවාරි මස 07 දින පෙ.ව. 09.30 ට රැස් විය යුතුය."*

## 05. වාර්ෂික මුදල් ප්‍රකාශය : 2014

ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව යළිත් සභාභිමුඛ කරන ලදී.

*"2014 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද මුදල් ප්‍රකාශය අනුමත කළ යුතුය."*

## 06. පොදු සාකච්ඡාව :

පූ.භා. 09.25 ට පොදු සාකච්ඡාව ආරම්භ විය.

***පූ.භා. 10.57 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ විය.***

***ප.භා. 01.06 ට පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, ප.භා. 02.06 ට ගරු සභාපතිතුමාගේ [සුනිල් විජේරත්න මහතා] ප්‍රධානත්වයෙන් යළිත් රැස් විය.***

***අ.භා. 02.47 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, සුමිත් විජයමුණි ද සොයිසා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

අ.භා. 04.28 ට පොදු සාකච්ඡාව අවසන් විය.

## 07. කල් තැබීමේ යෝජනාව :

සුනිල් ජයමිණි ගරු සභානායකතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "*දැන් මෙම සභාව කල් තැබිය යුතුය.*"

***ඊට අනුකූලව පළාත් සභාව, අ.භා. 04.30 ට, 2013 දෙසැම්බර් මස 04 වන දින පූ.භා. 09.00 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.12.03
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල, බී පර්යන්තය,
සෙත්සිරිපාය, බත්තරමුල්ල.

පූර්/03 Minuts 2013.12.03 - Hansard Section